ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
முதியோர்களுக்கான தேசிய செயலகம்
**National Secretariat for Elders**

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
**Ministry of Rural Development, Social Security and Community Empowerment**

*සක්‍රිය වැඩිහිටි වියක් උදෙසා* -செயலூக்கமான முதுமையை நோக்கி- *Towards an active ageing*

| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | NSE/DEV/ESSF/8 | ඔබේ අංකය<br>உனது இல.<br>Your No. | |
| දිනය<br>திகதி<br>Date | 2025.05..19 | | |

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත

<u>වැඩිහිටියෝ සඟරාවට ලිපි ලබාගැනීම සම්බන්ධවයි</u>

2025 වර්ෂයේ ජාත්‍යන්තර වැඩිහිටි දිනයට සමගාමීව වැඩිහිටියෝ සඟරාව ප්‍රකාශයට පත්කිරීමට මෙම වර්ෂයේත් කටයුතු සංවිධානය කරමින් පවතී.

02. ලංකාවේ මුද්‍රිත මාධ්‍ය අතර විවිධ පුවත්පත්, සඟරා ප්‍රකාශයට පත්වන නමුත් වැඩිහිටි ප්‍රජාවගේ අවශ්‍යතාවය වෙනුවෙන් පුවත්පත් හෝ සඟරාවක් ජාතික මට්ටමින් මුද්‍රණය වන්නේ නැත. එම අඩුව සපුරාලනු පිණිස මෙම වර්ෂය සඳහා ද වැඩිහිටියන්, පාසැල් ශිෂ්‍යය/ශිෂ්‍යාවන් හා විද්වතුන් ඇතුළු සැමගෙන් නිර්මාණ කැඳවමින් වැඩිහිටියෝ සඟරාව ප්‍රකාශයට පත්කිරීමට තීරණය කර ඇත.

03. මේ සඳහාවන සියළුම නිර්මාණ <u>2025.07.30</u> වන දිනට පෙර ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ලැබීමට සලස්වන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. මේ සඳහා නිර්මාණ තෝරා එවීම සම්බන්ධයෙන් වූ නිර්ණායක ද මේ සමග අමුණා ඇත.

04. සියළු නිර්මාණ තෝරා එවීමේදී මේ සමග අමුණා ඇති ඇමුණුම අංක - 01 හි සඳහන් නිර්ණායක පදනම් කරගත යුතුය. එමෙන්ම සියළුම නිර්මාණ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයෙන් ලබාදී ඇති අයදුම්පත ඔබගේ නිර්දේශය සහිතව එවන මෙන් ද වැඩිදුරටත් කාරුණිකව ඉල්ලා සිටිමි.

කේ.චතුර මිහිඳුම්
අධ්‍යක්ෂ

ලිපිනය : 2 වන මහල, D කොටස, සෙත්සිරිපාය - දෙවන අදියර, බත්තරමුල්ල.
முகவரி : 2ஆம் மாடி,தொகுதி D,செத்சிறிபாய-கட்டம் II,பத்திரமுல்லை
Address : 2nd Floor,Block D, Sethsiripaya- II Stage, Baththaramulla.
ඊ-මේල්/ ஈ-மெயில்/ E-mail : nsemss@gmail.com
ෆැක්ස්/ பெக்ஸ் / Fax : 0112187015

දුරකථන / தொலைபேசி/ Telephone:
අධ්‍යක්ෂ / பணிப்பாளர் / Director : 0112187045
කාර්යාලය / அலுவலகம் / Office
සංවර්ධන අංශය :0112054164
ආයතන අංශය :0112054136
[illegible] :0112054138

**ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් එළිදක්වනු ලබන "වැඩිහිටියෝ සහරාවට" නිර්මාණ ලබා ගැනීමේ ඉල්ලුම් පත්‍රය - 2025**

1.නම :- ..........................................................................................................................

2.ලිපිනය:-.........................................................................................................................

..................................................................................................................

3. දුරකතන අංකය :- ස්ථාවර ................................ ජංගම ..................................

4.නිර්මාණ වර්ගය:- ...........................................................................................................

5.නිර්මාණයේ නම:- ..........................................................................................................

5.ග්‍රාමීය කමිටුවේ/බල මණ්ඩලයේ නම සහ ලිපිනය ...............................................................

..........................................................................................................................

......................................................................................................... යන පද්‍ය රචනාව / ලිපිය / කෙටිකතාව / මගේම නිර්මාණයක් බවට සහතික කර 2025 වැඩිහිටියෝ විශේෂ කලාපයේ පල කිරීම සඳහා මේ සමග ඉදිරිපත් කරමි.

.......................................... ..........................................

දිනය අත්සන

....................................................... දිස්ත්‍රික්කය වෙත ලැබුන නිර්මාණ අතරින් ..................................

.................. යන පද්‍ය /කෙටිකතාව/විශේෂාංග ලිපිය 2025 වැඩිහිටියෝ විශේෂ කලාපයේ පලකිරීම සඳහා නිර්දේශ කර මේ සමහ ඉදිරිපත් කරමි.

.......................................... ..........................................................

දිනය දිස්ත්‍රික් වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරී

.........................................................................................................................යන නිර්මාණය

............................................... හොඳම නිර්මාණ දහය අතර වන බැවින් 2025 වැඩිහිටියෝ විශේෂ කලාපයේ පලකිරීම සඳහා අනුමත කර මේ සමග ඉදිරිපත් කරමි.

...................................... ..................................................

දිනය දිස්ත්‍රික් ලේකම්

ඇමුණුම - 01

## 2025 වැඩිහිටියෝ විශේෂ කළාපය සඳහා නිර්ණායක

(01). කාව්‍ය නිර්මාණ

- සඳැස් හා නිසඳැස් මාධ්‍ය දෙකෙන්ම නිර්මාණ ඉදිරිපත් කළ හැකිය
- විරිත, ඡන්දස් ,අලංකාර,සහිත අර්ථවත් නිර්මාණ කෙරේහි වැඩි අවධානය යොමු කළ යුතුය.
- පද්‍ය පන්තියක් උපරිම කවි 10 කට සීමා විය යුතුය. (සඳැස් සඳහා අදාළ වේ).
- උපමා,රූපක,කාව්‍ය රසයටහා අර්ථයට ගැලපිය යුතුය.
- උචිත පරිදි උත්ප්‍රාසය,උපහාසය භාවිතා කළ හැකිය.
- කවි රචනයට ගැලපෙන සේ අවශ්‍ය නම් සිතුවම් / ඡායාරූප සහිතව නිර්මාණාත්මකව ඉදිරිපත් කළ හැකිය.
- තනි පිටුවේ පරිගණක ගතකර හෝ පැහැදිලි අත් අකුරෙන් තිබිය යුතුය.
- දේශපාලන මතවාද හෝ පුද්ගලික පහරදීම්/අනුචිත තේමා තෝරා නොගත යුතුය.

(02). කෙටි කතා

- දළ වශයෙන් වචන 2000 ක උරිමයකට යටත්ව පැහැදිලි අත් අකුරෙන් ලියා හෝ පරිගණක ගතකර හෝ යතුරුලියනය කර තිබිය යුතුය.

(03). නිර්මාණාත්මක ලිපි

- ගැලපෙන මාතෘකාවක් යටතේ ( ඒ-4) ප්‍රමාණයේ උපරිම පිටු තුනක් පමණ විය යුතුය
- නිර්මාණශීලි හා විචාරශීලි නව අදහස් සහිත ලිපි පිළිබඳ වැඩි අවධානයක් යොමු කරනු ඇත.
- උපුටා ගැනීම් හෝ වෙනත් අයගේ නිර්මාණ හෝ මීට පෙර පල කරන ලද නිර්මාණ ඉදිපත් නොවිය යුතුයි

(04). පොදු කරුණු .

- පැහැදිලි අත් අකුරෙන් ලියා හෝ යතුරු ලියනය/පර්ගණක ගතකර කර හෝ තිබිය යුතුයි.
- නිර්මාණ භාරගන්නා අවසාන දිනය වන **207.07.30** දිනට පසුව ලැබෙන සියළුම නිර්මාණ හා අයදුම් පත රහිතව හෝ නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුමැතියෙන් තොරව ඉදිරිපත් කරනු ලබන සියළුම නිර්මාණ ප්‍රතික්ෂේප වනු ඇත.
- ඔබ වෙත ලැබෙන සඳැස් / නිසඳැස්/ කෙටිකතා යන නිර්මාණවල එක් වර්ගයකින් හොඳම නිර්මාණ 10 තොරා **207.07.30** දිනයට පෙර මා වෙත එවන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.